 

# කොරියානු රැකියාවක් අපේක්ෂාවෙන් කොරියානු රැකියා වෙබ් අඩවියේ ලියාපදිංචි වී ඇති රැකියා අයදුම්කරුවන්ගේ අවධානය සඳහා

**ඉදිරියේදී ඔබට කොරියානු රැකියාවක් සඳහා සේවා ගිවිසුමක් ලදහොත් සේවා ගිවිසුම අත්සන් කිරීම සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත්‍රය පැහැදිලිව තිබිය යුතුය. එබැවින් අපැහැදිලි ජාතික හැඳුනුම්පත් ඇත්නම් නව ජාතික හැඳුනුම්පතක් සකස් කර එම නව ජාතික හැඳුනුම්පත් අංකය ආගමන විගමන දෙපාර්තමේන්තුව මඟින් විදේශ ගමන් බලපත්‍රයෙහි පිටු අංක 04හි ඇතුළත් කරගත යුතුය.**

**ඔබ විසින් ලබාගන්නා ලද පොලිස් නිෂ්කාෂණ වාර්තා වලංගු වන්නේ මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එබැවින් මාස 06 ඉක්මවූ වහාම නව පොලිස් වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරන්න. කාර්යාංශය විසින් ඔබ වෙත නැවත පොලිස් නිෂ්කාෂණ වාර්තාවක් ලබාගැනීමට ලිපියක් එවනු ලැබූ විගසම ඒ සඳහා අයදුම් කිරීමට කටයුතු කළ යුතුය.**

## සේවා ගිවිසුමක් අත්සන් කිරීමට පහත සඳහන් ලේඛන අවශ්‍ය වේ.

1. ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපත් 04ක්

2. විදේශ ගමන් බලපත්‍රය හා එහි ඡායාරූපය සහිත පිටුවේ ඡායා පිටපත් 06ක්

3. වීසා ගාස්තු, කාර්යාංශ ලියාපදිංචි ගාස්තු, බඳවා ගැනීම් ගාස්තු, ගුවන් ටිකට්පත් ගාස්තු හා වෙනත් වියදම් සඳහා ආසන්න වශයෙන් රු. 225,000/-ක පමණ මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරන බැවින් එම මුදල් කල්වේලා ඇතිව සූදානම් කරගත යුතුය. ඔබට අවශ්‍ය නම් බැංකු ණය මුදලක්ද ලබාගත හැක. (මෙම මුදල් ප්‍රමාණය වෙනස් විය හැක.)

4. සේවා ගිවිසුමක් ලද ඔබට කොරියානු රටට පිටත්වීමට පෙර ඇප බැඳුම්කරයක් අත්සන් කිරීම සඳහා ස්ථිර සේවයේ නියුතු රාජ්‍ය සේවකයෙකු අවශ්‍ය වන අතර, විශ්‍රාම යාම සඳහා අවුරුදු 05ක්වත් ඉදිරියට සේවා කාලය තිබිය යුතුය. (සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලද ඇතුළත්ය.)

5. ඔබගේ තොරතුරු කොරියානු වෙබ් අඩවියට ඇතුළත් කළ පසු ඔබ සම්බන්ධයෙන් කොරියානු මානව සම්පත් ආයතනය ගනු ලබන පියවරයන් පිළිබඳ තොරතුරු ඔබටම බලාගැනීම සඳහා **EPS** ගිණුමක් සාදා ගැනීමට පහත සඳහන් පියවරයන් අනුගමනය කරන්න.

# EPS ගිණුමක් සාදා ගන්නා ආකාරය

(ගිණුම සෑදීමට පෙර මෙය කියවා වටහා ගන්න.)

1. අන්තර්ජාලයට පිවිස **www.eps.go.kr** ලෙස **type** කර හෝ **employment permit system** ලෙස **search** කරන්න.

2. **employment permit system** ලෙස සඳහන් පිටුවට පිවිසෙන්න. එහි වම්පස කෙළවරේ කහ පැහැයෙන් වර්ණ ගන්වා ඇති කොටසේ ඇති **sign up** යන්න **click** කරන්න.

3. ◎ **EPS - TOPIK ID + Passport Number or National ID Card Number** මෙම ස්ථානයේ ඇති රවුම පාට වී නොමැතිනම් පමණක් එය click කරන්න.

4. මෙම පිටුවෙහි පහළ දකුණු කෙළවරේ ඇති [ NEXT ] යන්න click කරන්න.

5. EPS -TOPIK [ ] මෙම කොටුව තුළ 0072019C ලෙස type කර ඔබගේ විභාග අංකය යොදන්න. (කොටුව තුළ අංක 16ක් ඇතුළත් විය යුතු අතර මෙහි **'C'** අකුර කැපිටල් විය යුතුය.)

   උදා: 0072019C xxxxxxxx

**007**- යනු අප රටට අයත් code එක වේ. **2019 -** යනු විභාගය කරන ලද වර්ෂය වේ.

6. ◎ Passport No.* [ ] ID Card No.* [ ]

   ගමන් බලපත්‍ර අංකය හෝ හැඳුනුම්පත් අංකය අදාල ස්ථානයේ යොදන්න. ගමන් බලපත්‍ර අංකයේ **'N'** අකුර කැපිටල් විය යුතු අතර හැඳුනුම්පත් අංකයේ **'V'** අකුර ඇත්නම් එය ද කැපිටල් විය යුතුය.

7. දැන් පහළ දකුණු කෙළවරේ ඇති [ Confirm ] යන්න click කරන්න.

8. පසුව ලැබෙන පිටුවේ එකඟවීම් 05ක් ඇත. එම එක් එක් ප්‍රශ්නය අවසානයේ ඇති කුඩා කොටුව තුළ ' ✓ ' ලකුණ යොදන්න. පසුව පහළ ඇති [ Confirm ] මත click කරන්න.

9. පසුව ලැබෙන පිටුවේ ඔබට login වීමට අවශ්‍ය ID එක හා password එක ඉල්ලයි. මෙහිදී ඉතා පහසුවෙන් මතක තබා ගත හැකි login ID එකක් යොදන්න. (නමේ මුල් කොටස හා උපන් වර්ෂය)

උදා: harsha1981

Password දෙවරක් යෙදිය යුතුය. (මෙය ඉතා හොඳින් රහසිගතව මතක තබාගත යුතුය. අමතක වේනම් ලියා තබාගන්න.)

**ගිණුම සෑදිය හැක්කේ එක් වරක් පමණක් බැවින් ඉතාම කල්පනාකාරී විය යුතුය.**

**සැ.යු**

**ඔබ විසින් මෙම EPS ගිණුම සකස් කරගෙන නොමැති අවස්ථාවක එම ගිණුම සෑදීමට අවශ්‍යම තොරතුරු වෙනත් අයෙකුට ඔබ ලබාදී තිබේනම් එම අයට ඔබ වෙනුවෙන් ගිණුමක් සකස්කර ඔබ පිළිබඳව යාවත්කාලීන වන තොරතුරු නිරීක්ෂණය කර ඔබව නොමග යැවිය හැකිය. එබැවින් මෙම ගිණුම ඔබම සකස්කරගෙන ඔබගේ තොරතුරු පිළිබඳව සිදුවන නව්‍යතාවයන් ඔබම නිරීක්ෂණ කරගැනීමට කටයුතු කරන්න.**

**මෙම අවස්ථාව ඔබ වෙත ලබාදී ඇත්තේ වෙනත් අයෙකු මත යැපි තොරතුරු ලබාගැනීම නිසා සිදුවන විවිධ දූෂණ අක්‍රමිකතා වැලැක්වීම සඳහාය.**

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය